2016-07-27

Learning Resource Center

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# ඉතිහාසය

විභාග අංකය: ......................................................

| 10 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 යි. |
|---|---|---|

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ඉතිහාසය විෂය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය පහත ඒවායින් කුමක් ද?
    (1) ඉතිහාසය විෂය මගින් රජවරුන් පිළිබඳ අධ්‍යයනය කෙරේ.
    (2) පුරාවිද්‍යා කැනීම්වලින් තොරතුරු සොයන විෂයකි.
    (3) මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳ හදාරන විෂයකි.
    (4) කාසි, නටඹුන්, සෙල්ලිපි පිළිබඳ හදාරන විෂයකි.

02. ගම්පොල රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය කාලය දක්වා මෙරට දේශපාලන තොරතුරු හෙළි කරන සාහිත්‍ය මූලාශ්‍රයකි.
    (1) රාජාවලිය. (2) පූජාවලිය.
    (3) එදා හෙළදිව. (4) නිකාය සංග්‍රහය.

03. ලංකාවට නොපැමිණි එහෙත් අප රට පිළිබඳ නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන විදේශ ලේඛකයෙකි.
    (1) ටොලමි (2) ඉබන් බතුතා
    (3) පාහියන් හිමි (4) රිබෙයිරෝ

04. ඉතිහාසය නිවැරදිව ඉගෙන ගැනීම සඳහා අනුගමනය කළ යුත්තේ පහත කුමන ක්‍රියාමාර්ගයක් ද?
    (1) කතන්දර ඇසුරින් ඉගෙනීම. (2) සෙල්ලිපි අධ්‍යයනය කිරීම.
    (3) ගවේෂණාත්මකව ඉගෙන ගැනීම. (4) ඉතිහාසය පොත් කියවීම.

05. "අ" කොටසේ දක්වා ඇති විදේශ ලේඛකයන් "ආ" කොටසේ ඔවුන් රචනා කළ කෘති සමඟ ගැළපූ විට පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" | |
|---|---|---|---|
| i. | පිලිප්පස් බැල්ඩියස් | A. | දේශාටන වාර්තා |
| ii. | හියුං සියැං | B. | ඉන්ඩිකා |
| iii. | ඇරිස්ටෝටල් | C. | ඩිමුන්ඩෝ |
| iv. | මෙගස්තිනිස් | D. | ලංකා පුරාවෘත්තය |

    (1) DABC (2) DACB
    (3) BACD (4) CABD

06. පහත සඳහන් සිදුවීම් සිදු වූ අනුපිළිවෙළ නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

A. හෝමෝසේපියන්ස් මානවයා බිහි වීම.

B. ලංකාව ජනාවාස වීම.

C. පෘථිවියේ මහා හිම සමය

D. මැටිඔරු සුසාන

E ඉරණමඩු සැකැස්මට අයත් ශිලා මෙවලම් හමුවීම.

(1) CABE (2) CABD

(3) ACBD (4) ABCE

07. සාහිත්‍ය මූලාශ්‍ර මගින් විස්තර කෙරෙන අතීත කාලයේ ආරම්භයට පෙර තිබූ යුගය පොදුවේ හඳුන්වනුයේ,

(1) මුල් ඓතිහාසික යුගය නමිනි. (2) ප්ලයිස්ටොසීන යුගය නමිනි.

(3) පූර්ව ඓතිහාසික යුගය නමිනි. (4) ප්‍රාග් ඓතිහාසික යුගය නමිනි.

08. මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ තොරතුරු ලැබෙන බූන්දල, මිනිහාගල් කන්ද අයත් දේශගුණ කලාපය කුමක් ද?

(1) පහතරට අර්ධ ශුෂ්ක කලාපය (2) ශුෂ්ක කලාපය

(3) තෙත් කලාපය (4) පහතරට වියළි කලාපය

09. මෙරට විසූ ගල් යුගයේ මිනිසුන්ගේ ආහාර කෙබඳු වී දැයි අවබෝධ කර ගැනීමට ඉවහල් වන සාධක වැඩි වශයෙන් හමුවනුයේ,

(1) තෙත් කලාපීය ගල් ගුහාවලිනි.

(2) වෙරළ ආශ්‍රිත එළමහන් වාසස්ථානවලිනි.

(3) කඳුකර එළිමහන් දඩයම් ස්ථානවලිනි.

(4) පහතරට තෙත් හා වියළි කලාපීය ලෙන්වලිනි.

10. ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධි පිළිබඳ තොරතුරු මිනී වැළලීම ආශ්‍රයෙන් හෙළි වේ. රතු ගුරු ගල් ආලේපිත මිනිස් ඇටසැකිලි කොටස් හමු වූ ස්ථාන දෙකකි.

(1) බටදොඹලෙන - බෙලිලෙන (2) පාහියන්ගල - රාවණා ඇල්ල

(3) බූන්දල - පතිරාජවෙල (4) පිදුරන්ගල - අලිගල

11. පූර්ව ඓතිහාසික යුගය අප මුතුන් මිත්තන් තාක්ෂණික අංග රැසක් දියුණු කරගත් අවධියකි. මෙම යුගයට අයත් සාක්ෂි වඩාත් පැහැදිලිව අනාවරණය වී ඇත්තේ,

(1) වයඹ පළාතෙන් හා උතුරු පළාතෙන් ය.

(2) උතුරු මැද පළාතේ දකුණු දිග කොටසින් හා නිරිතදිග කොටසින් ය.

(3) මධ්‍යම පළාතේ ඊසාන දිග කොටසින් හා නිරිතදිග කොටසින් ය.

(4) සබරගමු පළාතේ ඊසානදිග කොටසින් හා ඌව පළාතේ නිරිත දිග කොටසින් ය.

12. මුල් ඓතිහාසික ජනාවාස අතර නාගරික ජනාවාස ද වර්ධනය විය. විශාල නාගරික ජනාවාස හැඳින්වීමට මූලාශ්‍රවල යොදා ඇති පදය වනුයේ,

(1) පුර ය. (2) පුරකමත ය.

(3) නුරුපුර ය. (4) අනුරපුර ය.

13. දහවන රාජ්‍ය වර්ෂයේදී ග්‍රාම සීමා සලකුණු කර ප්‍රථම වරට ග්‍රාම පාලනය විධිමත් කල රජතුමා වනුයේ,

(1) පණ්ඩුකාභය ය. (2) දේවානම්පියතිස්ස ය.

(3) වසභ ය. (4) දුටුගැමුණු ය.

14. ලංකාවේ මුල් ඓතිහාසික ජනාවාස වල ව්‍යාප්තිය මැනවින් පිළිබිඹු කරන්නේ,
   (1) සාහිත්‍ය මූලාශ්‍ර මගිනි.
   (2) විශාල වැව්වල ව්‍යාප්තිය මගිනි.
   (3) නටඹුන් මගිනි.
   (4) පැරණිතම ගම් වැව්වල හා මුල් කාලීන සෙල්ලිපිවල ව්‍යාප්තිය මගිනි.

15. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් කවරක් අසත්‍ය වේ ද?
   (1) මෙරට දේශපාලන බලය දියුණු වූයේ විජය කුමරුගේ පැමිණීමට පෙර සිටය.
   (2) පූර්ව රාජ්‍ය සමයේ මෙරට දේශපාලන බලය මධ්‍යගතව පැවතුනි.
   (3) වැඩි දෙනාගේ එකඟතාවයෙන් පත්වන පාලකයා හැඳින්වීමට මහා සම්මත යන වචනය යෙදේ.
   (4) ක්‍රි.පූ. 2400 තරම් ඈත කාලයක සිට මෙරට කෘෂි කාර්මික සමාජයක් දියුණු වෙමින් තිබුණි.

16. A - ගමිකයන් බිහි වීම.
   B - එල්ලංගා බිහිවීම.
   C - පරුමකයන් බිහිවීම.
   D - සමීප වැව් ඇළ මාර්ගවලින් සම්බන්ධ කිරීම
   E - ආහාර අවශ්‍යතා වැඩිවීම.
   ඉහත සිදුවීම් සිදු වූ අනුපිළිවෙළ දක්වූ විට පිළිතුර කුමක් ද?
   (1) DEBA (2) BCED
   (3) EDBC (4) EDBA

17. "අ" තීරුවේ රජවරුන් හා "ආ" තීරුවේ ඔවුන් හා සම්බන්ධ සිද්ධි සමග ගැළපූ විට පිළිතුර වනුයේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. වසභ | A. රජයේ බදු අය කිරීම් විධිමත් කිරීම. |
| 2. භාතිකාභය | B. නිශ්චිත පුද්ගලයෙකු වෙත දේශපාලන බලය මුල් වරට ඒකරාශි වීම. |
| 3. දෙවනපැතිස් | C. රෝමයෙන් පබළු ගෙන ඒම. |
| 4. දුටුගැමුණු | D. ප්‍රාදේශීය ප්‍රභූන් සමඟ සබඳතා ගොඩනගා ගැනීම. |

   (1) ADCE (2) BCDA
   (3) ACDB (4) DCEA

18. • තිලෝක සුන්දරී නම් කාලිංග කුමරිය විවාහ කර ගැනීම.
   • මිත්තා කුමරිය පාණ්ඩ්‍ය දේශයේ කුමරෙකුට විවාහ කරදීම.
   ඥාති සබඳතා මගින් දේශපාලන බලය ස්ථාවර කර ගැනීම සඳහා ඉහත විවාහ ක්‍රම යොදාගත් පාලකයා වනුයේ,
   (1) නිශ්ශංකමල්ල රජතුමා ය. (2) වසභ රජතුමා ය.
   (3) I වන විජයබාහු රජතුමා ය. (4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය.

• අංක 19-23 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු අදාළ කර ගනිමින් පිළිතුරු සපයන්න.
   A - හේමමාලා කුමරිය හා දන්ත කුමරු දළදා වහන්සේ වැඩම වීම.
   B - පොහෝ දින වෙළඳාම්කල අයගෙන් දඩයක් ලෙස තෙල් බඳ්දක් අය කල යුතුය.
   C - ස්ථිතික ජල විද්‍යා මූලධර්ම දැනුම
   D - වල්වල දඬුපත් නොකපනු ඉසා
   E - කුරුණි, අමුණු, කරීසය

19. A වලින් දැක්වෙන සිද්ධියට සම්බන්ධ වරාය වනුයේ,
(1) මහා තිත්ථ ය (2) ජම්බුකොල පට්ටන ය.
(3) දේවනගර් ය. (4) ලංකා පට්ටන ය.


20. C වලින් දැක්වෙන විද්‍යා දැනුම අප පැරැණ්නන්ට තිබූ බව හෙළි කරන නිර්මාණයකි.
(1) දිය කැට පහන (2) දැදිගම ඇත් පහන
(3) බිසෝ කොටුව (4) අනුරාධපුරයේ ගල් පාලම

21. B වලින් දැක්වෙන නීතිය සඳහන් සෙල්ලිපිය වනුයේ,
(1) සිතුල්පව්ව ය. (2) සොරබොර වැව ටැම් ලිපිය ය.
(3) කළුදිය පොකුණ ය. (4) බුද්ධන්නේ හෙල ය.

22. E වලින් දැක්වෙන මිනුම් අප පැරැණ්නන් භාවිත කළේ,
(1) දුර මැනීම සඳහා ය. (2) බර මැනීම සඳහා ය.
(3) කාලය මැනීම සඳහා ය. (4) අවකාශය මැනීම සඳහා ය.

23. පරිසර සංරක්ෂණයට පැරණි සමාජයේ තිබූ නීතියක් D වලින් දැක්වේ. එය දක්වා ඇත්තේ,
(1) කොණ්ඩවට්ට වාන් ටැම් ලිපියේ ය. (2) සොරබොර වැව ටැම් ලිපියේ ය.
(3) බුද්ධන්නෙහෙල සෙල් ලිපියේ ය. (4) අනුරාධපුර පුවරු ලිපියේ ය.

- 24-25 ප්‍රශ්නවලට පින්තූරය ආශ්‍රයෙන් පිළිතුරු දෙන්න.



24. මෙමගින් දැක්වෙන්නේ පැරැණ්නන්ගේ,
(1) ගල් සොහොන් සුසානයක් ය.
(2) මැටිඔරු සුසානයක් ය.
(3) යකඩ උණු කළ උදුනක් ය.
(4) බෙහෙත් ඔරුවක් ය.

25. මේවා හමු වී ඇත්තේ,
(1) සබරගමු පළාතේ සමතල වැව ප්‍රදේශයෙනි. (2) රංචාමඩමෙනි
(3) ඉබ්බන්කටුවෙනි. (4) පොම්පරිප්පුවලිනි.

26. මින්නේරි, ගිරිතලේ, කවුඩුල්ල වැව්වලට ජලය ගෙන ගිය ඇළ මාර්ගය වනුයේ,
(1) යෝධ ඇල ය. (2) ඇළහැර ඇල ය.
(3) මිණිපේ ඇල ය. (4) අංගමැඩිල්ල ඇල ය.

27. "අ" වලින් දක්වා ඇත්තේ කැණිම් කළ ස්ථාන කීපයකි."ආ" වලින් දක්වා ඇත්තේ පැරැණ්නන්ගේ තාක්ෂණ නිර්මාණ කීපයකි. "අ" හා "ආ" නිවැරදිව ගැළපූ විට පිළිතුර තෝරන්න.

| | අ | | ආ |
|---|---|---|---|
| 1. | අභයගිරිය | A. | වර්ණාලේපිත උළු |
| 2. | ජේතවනය | B. | වර්ණාලේපිත මැටි බඳුන් |
| 3. | මාදුරුඔය | C. | සියුම් කැටයම් සහිත රන් ආභරණ |
| 4. | උඩ රංචාමඩම | D. | පැරණි වැවක සොරොව්ව |

(1) ACBD (2) DBCA
(3) ACDB (4) ABDC

28. අනුරාධපුර හා ඒ අවට ජීවත් වූ දෙමළ ජනයාගේ ශුභ සාධන කටයුතු සොයා බැලීම සඳහා රාජ සභාවේ පත් කර සිටි නිලධාරියා වනුයේ,
(1) අයිනුරුවර් ය. (2) අගම්පඩි ය.
(3) දමෙඩ ය. (4) දෙමළ අධිකාරි ය.

2016 . 07 . 27 ඉතිහාසය
10 ශ්‍රේණිය .

Learning Resource Center
R
De Mazenod College
Kandana

29. පැරණි සමාජයේ විවිධ වෘත්තිකයන් හා ශිල්පීන් ද වැදගත් කාර්යභාරයක් කළෝය. ඒ අනුව "අචරි" හා "වොහාර" යනුවෙන් හඳුන්වා ඇත්තේ,
    (1) වෛද්‍යවරුන් හා නැට්ටුවන් ය. (2) ගුරුවරුන් හා කවීන් ය.
    (3) ගුරුවරු හා නීතිඥයින් ය. (4) නීතිඥයින් හා චිත්‍ර ශිල්පීන් ය.

30. ඓතිහාසික යුගයේ සමාජ ධූරාවලියේ ප්‍රභුවරුන්ගේ මට්ටමට පහළින් සිටියේ මහජනතාවයි. සෙල්ලිපිවල ඔවුන් හඳුන්වා ඇත්තේ,
    (1) කසිකාර ලෙස ය. (2) තුලාධර ලෙස ය.
    (3) වානිජ ලෙස ය. (4) කුඩීන් ලෙස ය.

31. උඩරට රාජධානිය ගොඩනැගූ රජතුමා වනුයේ,
    (1) සේනා සම්මත වික්‍රමබාහු ය. (2) ශ්‍රී වික්‍රම රාජසිංහ ය.
    (3) මායාදුන්නේ ය. (4) VI පරාක්‍රමබාහු ය.

32. A - ලංකාවේ පළමු නාගරීකරණය අනුරාධපුරය හා මාගම්පුර නගර බිහි වීමෙන් ඇරඹේ.
    B - දේශපාලන බලය විමධ්‍යගත වීම නිසා දෙවන නාගරීකරණය සිදුවේ.
    මෙම ප්‍රකාශ අතුරෙන්,
    (1) A පමණක් නිවැරදි ය. (2) B පමණක් නිවැරදි ය.
    (3) A හා B නිවැරදි ය (4) A හා B වැරදි ය.

33. තම මව සිහි වීම පිණිස පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන කරවන ලද්දේ,
    (1) II පරාක්‍රමබාහු රජු ය. (2) IV පරාක්‍රමබාහු රජු ය.
    (3) V පරාක්‍රමබාහු රජු ය. (4) VI වන පරාක්‍රමබාහු රජු ය.

34. මෙරට කාලිංග වංශිකයන් හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය උග්‍ර වූයේ කුමන රජුගේ මරණයෙන් පසුව ද?
    (1) නිශ්ශංකමල්ල. (2) මහා පරාක්‍රමබාහු.
    (3) V වන මිහිඳු. (4) I විජයබාහු.

35. ක්‍රි.ව. 1215 දී පොළොන්නරුව බිඳ වැටීමෙන් පසු ආරක්ෂිත ස්ථානවල රාජධානි පිහිටුවා ගෙන ඇතැම් ප්‍රාදේශීය නායකයින් රටත් ශාසනයත් රැක ගත්තේ ය. ඒ අනුව මහියංගනයේ ගංදෙණි පර්වතයේ බලකොටුවක් ගොඩනැගූ නායකයා වනුයේ,
    (1) සුභ සෙනෙවි ය. (2) සංඛ සෙනෙවි ය.
    (3) III වන විජයබාහු ය. (4) බුවනෙකබාහු ආදිපාද ය.

- 36 - 40 දක්වා ප්‍රශ්නවලට පහත දී ඇති පද හඳුනාගෙන පිළිතුරු සපයන්න.
  (A - මේකාප්පර්, B - කබොජ මහපුගිය, C - කාලිංග මාඝ, D - මධුපාචිකා, E - චන්ද්‍රභානු, F - අත්සුණු, G - රද්කොල් සමිඳරු)

36. අනුරාධපුර සමයේ මෙරට ක්‍රියාත්මක වූ ඇඟනිස්ථාන වෙළඳ සංවිධානයකි.
    (1) A (2) G (3) F (4) B
37. දඹදෙණි රාජධානි සමයේදී මොහුගේ ආක්‍රමණ එල්ල විය.
    (1) A (2) D (3) E (4) C
38. පැරැන්නෝ ධාන්‍ය වර්ග බැඳ කුඩු කොට සාදා ගන්නා ලද ආහාරයකි.
    (1) F (2) D (3) A (4) G
39. සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවෝ අතීතයේ හැඳින්වූ නම
    (1) A (2) D (3) E (4) G
40. නීති නියාමනය කරන ආරක්ෂක නිළධාරින් පැරණි සමාජයේ හඳුන්වා ඇති නම
    (1) D (2) E (3) A (4) B

26-07-2016

Learning Resource Center

මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2016

## ඉතිහාසය

විභාග අංකය: ........................................................

| 10 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 03 යි. |
|---|---|---|

**උපදෙස්**

- පළමු කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- II කොටසින් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

### I කොටස

01. (අ) පහත සඳහන් ස්ථාන සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.
(ගෝකණ්ණතිත්ථ, උරුවෙල, කලාඔය, අනුරාධපුරය, පිදුරන්ගල, බුන්දල, පොළොන්නරුව, රංචාමඩම, යාන් ඔය, ජම්බුකොල පට්ටන.) (ල. 10)

(ආ) පහත සඳහන් A හා B පින්තූර ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A රූපය

i. මෙය කුමන සංස්කෘතික අවධියට අයත් වේ ද?
ii. මෙය හමුවූයේ කුමන ස්ථානයෙන් ද?
iii. මෙහි ඇතැම් පබළු පිළිබඳ ඇති මතය ලියන්න.
iv. මේවා පැළඳීමෙන් එකල ප්‍රභූන්ගේ කවර කරුණක් හෙළි වේ ද? (ල. 04)



B රූපය

i. මේවා හමුවූයේ කුමන ස්ථානයේ කළ කැණීම් වලදී ද?
ii. කුමක් සඳහා භාවිත කර ඇත් ද?
iii. මෙම කැණීම් කළේ කුමන වර්ෂයේ ද?
iv. මෙම සොයා ගැනීම් තුළින් කුමන ක්ෂේත්‍රයක දියුණුවක් හෙළි කරයි ද? (ල. 04)

(ඇ) A,B,C,D වලින් අසා ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

A - පළමු වංශ කථාව
B - පැරණි ප්‍රදේශ මායිම් සලකුණු
C - පැරණි ම කාසි
D - පැරණිත ම සෙල්ලිපි අක්ෂර

(මස්ස කාසි, මහා වංශය, බ්‍රාහ්මීය, දීප වංශය, කහපණ, ඇත් අඩිය)

(ල. 04)

(ඈ) හිස්තැනට සුදුසු වචනය ඔබේ පිළිතුරු පත්‍රයේ අංක අනුපිළිවෙළින් ලියන්න.

1. පෘථිවියේ ........................................ වානරයෙකුගෙන් මානවකයෙකු බිහි වීමට හේතු විය.
2. පළමුවන විජයබා රජුට උදව් කළ ........................................ පිළිබඳව පනාකඩුව තඹ සන්නසේ දක්වේ.
3. යොදුන අතීතයේ ........................................ මැනීමට යොදා ගත් මිනුමකි.
4. අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා ........................................ රජු ය.

(ල. 04)

(ඉ) පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. සෙල්ලිපිවල "පන අදෙක" ලෙස දක්වා ඇති තනතුර කුමක් ද?
2. "පසවන්තිනාමශාලා" තැනූ රජු කවරෙක් ද?
3. සෙල්ලිපිවල "පිටිබිම්" ලෙස හඳුන්වන්නේ කුමක් ද?
4. මහා වංශය රචනා කළ මහානාම හිමියන් වැඩ විසූ පිරිවෙන කුමක් ද? (ල. 04)

## II කොටස

02. i. ලංකාව පිළිබඳ තොරතුරු හෙළි කරන,

A - රෝම B - ග්‍රීක C - චීන

සාහිත්‍ය මූලාශ්‍රවලට නිදසුන් එක බැගින් A,B,C අනුපිළිවෙළින් ලියන්න. (ල. 03)

ii. මහා වංශය සම්බන්ධ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රචනා වූ කාලය

B - මෙහි මුල් කොටස අවසන් වන්නේ කුමන රජුගේ රාජ්‍ය කාලයෙන් ද?

D - මෙහි අර්ථ විවරණය ට රචනා කර ඇති ටීකාව කුමක් ද?

E - මහා වංශය කුමන මූලාශ්‍ර කාණ්ඩයට අයත් වේ ද? (ල. 04)

iii. සාහිත්‍ය මූලාශ්‍ර විචාර බුද්ධියෙන් පරිශීලනය කළ යුත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ල. 05)

iv. පෞරාණික ස්ථාන ස්මාරක රැක ගැනීම සඳහා පාසල් සිසුවෙකු ලෙස ඔබට කළ හැකි කාර්යය පැහැදිලි කරන්න. (ල. 06)

03. i. මෙරට ජනාවාස කළ හෝමෝසේපියන් මානවයාගේ සංස්කෘතියේ ඇති වූ වෙනස්කම් අනුව ඉතිහාසය බෙදා දක්වන අවධි 03 ලියන්න. (ල. 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ

A - තෙත් කලාපීය ලෙනක් හා බහුලව ආහාරයට ගත් සත්ව වර්ගයක් ද,

B - වියළි කලාපීය ලෙනක් හා බහුලව ආහාරයට ගත් සත්ව වර්ගයක් ද ලියා දක්වන්න. (ල. 04)

iii. ගල් යුගයේ ප්‍රජාවගේ යැපීම් ක්‍රමය කරුණු 02ක් යටතේ පැහැදිලි කරන්න. (ල. 05)

iv. ප්‍රාග් ප්‍රජාවගේ අභිචාර මිනි වැළලීම ආශ්‍රයෙන් හෙළි වේ. තොරතුරු ලැබෙන ස්ථාන හා චාරිත්‍රවල ස්වභාවය දක්වමින් පැහැදිලි කරන්න. (ල. 06)

04. i. පූර්ව ඓතිහාසික යුගයේ අප ආදි මානවයාගේ සුසාන චාරිත්‍ර ක්‍රම 03 ක් ලියන්න. (ල. 03)

ii. මුල් ඓතිහාසික ජනාවාස අතර නොයෙකුත් වෘත්තිකයන් විසූ ගම් ද මූලාශ්‍රවල දැක්වේ.

A - ගොවීන් විසූ ගම් B - ධීවරයන් විසූ ගම්

C - වෙළඳ ගම් D - මැණික් ගැරුවන් සිටි ගම්

ඉහත A,B,C,D මූලාශ්‍රවල දක්වා ඇත්තේ කෙසේ දැයි අනුපිළිවෙළින් ලියන්න. (ල. 04)

iii. සංචාරක දඩයම් දිවිය වෙනුවට ගොවිතැනට යොමු වීමටත් ස්ථිර වාසිතාවය ඇති කර ගැනීමටත් පූර්ව ඓතිහාසික යුගයේ අප මුතුන් මිත්තන් පෙළඹුනේ ඇයි දැයි කරුණු 2 ක් යටතේ පැහැදිලි කරන්න. (ල. 05)

iv. මුල් ඓතිහාසික ජනාවාසවල ව්‍යුහය හා පාලනය මූලාශ්‍ර තොරතුරු දක්වමින් පැහැදිලි කරන්න. (ල. 06)

05. i. පැරණි ගම් පාලනයේ ගමිකයන් ඉටු කළ කාර්යන් 03ක් ලියන්න. (ල. 03)

ii. රාජ්‍යත්වය බිහිවීමෙන් පසු ගොඩ නැගුණු සංකල්ප කීපයක් පහතින් දැක්වේ. ඊට සම්බන්ධ රජවරු වරහනින් තෝරා A,B,C,D අනුපිළිවෙළට ලියන්න.

A - චක්‍රවර්ති B - නරේශ්වර

C - කුවේර D - දේවත්ව

(කූටකණ්ණ අභය, නිශ්ශංකමල්ල, මහසෙන්, වසභ, කාශ්‍යප) (ල. 04)

iii. මෙරට දේශපාලන බල වර්ධනයේ වැදගත් අවස්ථාවෙකි පරුමකයන් නම් ප්‍රාදේශීය ප්‍රභූ පිරිසක් බිහිවීම. මේ බව කරුණු 02ක් යටතේ පැහැදිලි කරන්න. (ල. 05)

iv. වසභ රජු රටේ අභ්‍යන්තර පාලනය විධිමත් ලෙස සංවිධානය කිරීමට ගත් ක්‍රියාමාර්ගයත්, පළමු වරට විශාල වැව් ඉදි කිරීමට පෙළඹීම කෙරෙහි බලපෑ සාධකයත් විස්තර කරන්න. (ල. 06)

06. අප පැරණි සමාජයේ පැවැත්මට අවශ්‍ය පොදු සේවා එකල පාලකයින් හොඳින් පවත්වාගෙන ගියෝ ය.

i. සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට ක්‍රියා කළ රජවරු තිදෙනෙක් පහත ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

(IV කාශ්‍යප, V වන මහින්ද, දෙවන පෑතිස්, මුටසීව, බුද්ධදාස) (ල. 03)

ii. පැරණි සමාජයේ ආර්ථිකයේ ප්‍රධාන අංශය වූයේ කෘෂි කර්මාන්තයයි.

A - අලුතින් සකසා ගත් හේන් හඳුන්වා දී ඇති නාමයත්

B - හේන්වලින් අය කළ බද්දක්

C - විශාල කුඹුරු යායවල් හැඳින්වීමට මූලාශ්‍රවල යොදා ඇති නාමයත්

D - ගෘහණියක් කිරි දෝවනය කරන ඉපැරණි කැටයමක් ඇති ස්ථානයත්

A, B, C, D අනුපිළිවෙළින් ලියන්න. (ල. 04)

iii. පැරණි සමාජයේ අවශ්‍යතා සපුරාලීමට හැකි කර්මාන්ත ද හොඳින් සංවිධානය වී තිබුණි.

A - ලෝහ කර්මාන්තය හා

B - පේෂ කර්මාන්තය ආශ්‍රයෙන් මූලාශ්‍ර තොරතුරු දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. අන්‍ය සංස්කෘතීන්ට අයත් ජන කණ්ඩායම් සමග සුහදශීලීව ජීවත් වීම, අපේ රටේ ඉතිහාසය තුළ කැපී පෙනෙන ලක්ෂණයකි. ඓතිහාසික මූලාශ්‍ර තොරතුරු සමගින් පැහැදිලි කරන්න. (ල. 06)

07. i. ඓතිහාසික යුගයේ පාලකයන් විශාල වැව් තැනීමට උනන්දු වූ හේතු 03ක් ලියන්න. (ල. 03)

ii. නූතන නාමයන්ගෙන් නොවුවත් විද්‍යාත්මක මූලධර්ම අප පැරැණ්නෝ එදිනෙදා කාර්යන්හි යොදා ගත්තෝ ය.

A - පාෂාණ කැබලි දෙකක් වෙර යොදා පතුරු ගලවා මෙවලම් තැනීම.

B - උඩරංචාමඩමේ නේවාසිකයේ බිත්ති ලම්බකව බැඳීම.

C - සොහොන් ගර්භවල මැටි නල සවි කර තිබීම.

D - රුවන්වැලි සෑයේ "වජ්‍රචුම්බට" නම් උපකරණයක් සවි කිරීම.

ඉහත අවස්ථාවල දී යොදාගත් විද්‍යාත්මක මූලධර්මය පහත ලැයිස්තුවෙන් තෝරා A, B, C, D අනුපිළිවෙළින් ලියන්න. (පීඩන ශල්කනය, ස්ථිති විද්‍යුතය, ගුරුත්වාකර්ෂණය ශූන්‍ය කිරීම, දහනය සඳහා ඔක්සිජන් වායුව භාවිතය, ස්ථිතික ජල විද්‍යාව) (ල. 04)

iii. විශාල වැව්වල රළපනාව හා සොරොව්ව යන අංශවලින් ඉටු කළ කාර්යය හා විද්‍යාත්මක ක්‍රමවේදය පැහැදිලි කරන්න. (ල. 05)

iv. පුරාණ කාලයේ රටේ ජීවත් වූ වැසියන් අතර බහුලව භාවිත වූයේ මැටි බඳුන් ය. ඒවා උසස් ලෙස නිපදවීමට යොදා ගත් තාක්ෂණික ක්‍රමවේද කරුණු 02ක් යටතේ පහදන්න. (ල. 06)

08. i. ඓතිහාසික යුගයේ ලංකාවේ පැවති සමාජ සංවිධානයේ ප්‍රභූන් ලෙස සැලකූ තිදෙනෙකු ලියන්න. (ල. 03)

ii. කැඳ වර්ග අනුභවය අපගේ පැරණි සිරිතකි. එය දිරවා ගැනීමට පහසු ආහාරයකි.

A, B, C, Dවලින් දක්වෙන ආකාරයට සකසා ගත් කැඳ වර්ග හඳුන්වා ඇති ආකාර පහත වරහන් තුළින් තෝරා ලියන්න.

A - සහල් වතුරින් තම්බා ලුණු මිශ්‍ර කර සෑදූ කැඳ

B - සහල් එක් කොටසකට වතුර කොටස් 6 ක් යොදා රෝගීන් සඳහා තැනූ කැඳ

C - බෙහෙත් ගුණ ඇති කොළ වර්ග යොදා සකස් කළ කැඳ

D - කිරෙන් පිස මී පැණි හා ගිතෙල් යොදා තැනූ කැඳ

(රස උළු කැඳ, යවාගු, දිය කැඳ, ඇඹුල් කැඳ) (ල. 04)

iii. අප පැරැණ්නෝ පරිසර සංරක්ෂණය කළ ආකාරයත් පරිසර ආරක්ෂාව සඳහා පැවති නීති රීතිත් මූලාශ්‍ර තොරතුරු දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. පැරණි සමාජ සංවිධානයෙන් වර්තමානය ට ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න. (ල. 06)


09. i. පොළොන්නරු රාජධානිය පාලනය කළ රජවරු තිදෙනෙක් පහත ලැයිස්තුවෙන් තෝරා ලියන්න. (නිශ්ශංකමල්ල, V මිහිඳු, ධාතුසේන, I විජයබා, I වන පරාක්‍රමබාහු, වසභ) (ල. 03)

ii. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමෙන් පසු තිරිත දිග කලාපයේ නව නගර බිහි විය. එසේ බිහි වූ නගර (පාලන මධ්‍යස්ථාන) 04 ක් ලියන්න. (ල. 04)

iii. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු 02ක් පැහැදිලි කරන්න. (ල. 05)

iv. දෙවන නාගරීකරණය යටතේ බිහි වූ පාලකයින් අතරින් III වන විජයබා රජු විදේශ බලය ඉදිරියේ ජනතාවට ද ආරක්ෂාව සපයමින් ශාසනික කටයුතු ද සිදු කළ ආකාරය නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල. 06)

2016.07.26 ඉතිහාසය.
10 ශ්‍රේණිය.




Learning Resource Center
R